ගණිත විෂයට අත්වැලක්

Mathematics - Part 3

Athil Goonesekera
BSc (Sri J'Pura), MSc Elect.Eng.(Latrobe), DipEd(Latrobe)
Secondary School Teacher

දීර්ඝ බෙදීම (Long Division) කෙටියෙන් නොකරමු !!!!

හිතවත් දෙමාපියනි, එදා අපි දීර්ඝ බෙදීම ඉගෙනගත් ආකාරය තවමත් මතක ඇතැයි සිතමි. මෙම ක්‍රමය ඉතාම සාර්ථක සහ දීර්ඝ කාලීනව ප්‍රයෝජනවත් ක්‍රමයකි. මෙම ක්‍රමය නම්:



අද බොහෝ ළමුන් මෙම ක්‍රමයට පිටතින් කෙටි ක්‍රමයක් (හඹරට ඵඉවඉසඉඹන, තහඉචඟ ඉස ඉන ටහඑ ඇ ඊඊ චඋරරඉචඋලඋම) අනුගමනය කර බෙදීමේ කර්මය භාවිතා කරනු ලැබේ. මෙම කෙටි ක්‍රමයේ කිසිම වරදක් නොමැත. නමුත් ගැටලුව ඇති වන්නේ ඔප පන්තියේදී වීජ ගණිතමය දීර්ඝ බෙදීම ඉගෙන ගන්නා විටදීය. ඉහත සඳහන් කෙටි



ක්‍රමය වන්නේ:
Calculators භාවිතයෙන් මෙය විසඳිය හැකි වුවද එය ඉතාම අනුවණ ක්‍රියාවකි.

පහසු ක්‍රමයට නිතැතින්ම යොමුවීම සාමාන්‍ය සිරිතකි. නමුත්, දෙමව්පියන් වශයෙන් අපගේ යුතුකම වන්නේ තරමක් අපහසු ක්‍රමයේ ඇති වැදගත්කම හා එයින් ජනනයවන යහපත් ප්‍රතිඵල ළමයාට අවබෝධකර දීමයි. දීර්ඝ බෙදීමට දරුවා කුඩා කාලයේදීම හුරු කළහොත් එහි ඇති තරමක් දීර්ඝ ගතිය ඔහුගේ මනසින් තුරන් කළ හැකිය.

Dear students, today we will discuss about the importance of Long Division.

It is a common practice that student uses short division for dividing numerical numbers. The convenience of short division can be experienced when your divisor is a single digit number (e.g.: 745 ÷ 3). If the divisor is two or more digit number (e.g.: 49507 ÷ 24), it is not that easy to apply the short division since you are not familiar with tableds of two/three digit numbers.

Long Division is a method where it shows that actually what is being happened while dividing. This makes you more understandable what is really behind when you divide divident by a divisor. Further, knowing to apply long division is a gate way to be success in the most of VCE advanced algebra. Following are the few examples for algebraic long division.



Source: Maths Quest Unit 1&2



The following tutorial will guide you towards few confusable circumstances which can be arrised in long division. If you have any enquires please feel free to contact me.

Tutorial
For Junior & senior students (No Calculators & only by long division)

1. 39 ÷ 2
2. 51018 ÷ 3
3. 427÷3
4. 3384 ÷ 8
5. 6014 ÷ 2
6. 3875 ÷ 17
7. 49507 ÷ 24
8. 661201 ÷ 32

For VCE students (No Calculators)

1. (x2+6 x+8) ÷ (x+2)
2. (2x3+7x2+2 x-3) ÷ (x+3)
3. (x3+4x2+2 x+9) ÷ (x+2)
4. (x3-5x2-7 x-4) ÷ (x-1)
5. (3x3+5x2-4 x+3) ÷ (x-5)
6. (7x3-7 x+2) ÷ (x+3)
7. (2x3-4x2+2 x+3) ÷ (x2-2 x -1)
8. (x3-1) ÷ (x-1)

Your ideas suggestions and criticisms always welcome to improve this series of articles. Please don't hesitate to contact the author via pasqualathil_g@curl.aunz.net . The author wishes you all the Very Best.

පියාණන් ගොසින් අප සැම දා නිවනේ

මියගොස් වසර හතරක් ගත වුවද එල් බී ඒකනායක නාමය අපට කිසිදා අමතක නොවේ. මෙල්බන් පුරවරයේ බිහිවු අභීත ලේඛකයෙකු වු එල් බී, සිංගරුපාය, විසි÷වෙනි සියවස වැනි හරවත් ගුවන් විදුලි වැඩ සටහන් එදා ඉදිරිපත් කළ හැටි අපට තවමත් මතකය. සත්‍යය දරා සිටින්නට බැරි වියරු බලවේග විසින් නිහ: කරවනු ලැබ සිටි මේ වියතා ලෙඩ ඇඳේ සිටියදී නව මැදිරි කවුළුවෙන් නම් කවි පොතක් ද ලියා පළ කළේ ය. අද දවසේ සිදුවන දේ ඇසෙන දකින විට එල් බී ඒකනායක වැනි වියතුන්ගේ සැබෑ ගුවන්විදුලි ශිල්පීන්ගේ අගය තව තවත් වැඩියෙන් දැනෙයි.

කරමින් ගුවන් විදුලිය වෙත ආ ගමන
දෙවමින් අවවාද එහි දියුණුව දකින
බලමින් හිඳ පසෙක දෙස අන් අය තුටින
සැනෙකින් ඔවා දුනි කරමින් උන් සුදන

අපමණ වෙහෙස විඳ වැට සටහන් තුළීනා
සැමතැන දීම සැම හට ගරු කළ පෙමිනා
නොමගෙන මහා කම විද්වත් කම තුලිනා
පෙරමුණ ගෙන ගියා මහ සිහ රද ලෙසිනා

පියාඹන විහඟ කැළ මෙන් උඩු ගුවනේ
පියා හැර බැලුව මනු ලොව සැම දෙසිනේ
පියා නෙතු පියන් සදහට මතු ඉතිනේ
පියාණන් ගොසින් අප සැම දා නිවනේ

ගතවුන සිව් වසර සැම දින මොහොතකම
සිහිකළ අරුම ඔබ කළ කී දේ සැවොම
පොබකළ මෙපුර එල් බී නම් වූ උතුම
අපමණ වරක් සිහි කරනෙම් මම මෙහෙම

කෙනෙකුට නොහොබිනා නොසරුප් අවලාද
විසිරූ කෙනෙහිලුන් කළ දේ දුටුවා ද
වියතුන් ගුණ නොදත් උන් ජය ලැබුවාද
උතුමන් නැතිව ගියෙ අප සැමටම නේද

කැන්ගරු දෙසේ සිංහල ජනතා ව මුවේ
සුන්දර සිනාවක් රැඳවු යුගය මැවේ
ලංකර අපේ හිත් රඳවා සුහද බවේ
සින්ගරු පාය හැදු හැටි අමතකව නොයේ

සැනෙකින් උඩුව යටි කරවු දෙස් පලුවන්
සහ දේශයට වින කළ ඉගිරිසි ගැත්තන්
පලු කර පතුරු ගැසු හැටි අප කලු සුද්දන්
විසිවෙනි සිය වසින් ගෙන ආ හැටි කැන්දන්

ලේකකයෙකුගෙ පන්හිඳ තුළ ඇති බලය
පෙන්වා නැගූ සිහ නද අමතක නැතිය
නුඹ අතහැර ගියද නිම නොම කර මෙහෙය
තවමත් වැලපේය පන්හිඳ සහ කොලය

රෝහණ කරුණාරත්න

සාහිත්‍ය චින්තා සිංහල සාහිත්‍ය සම්මේලනය

සිඩ්නි සාහිත්‍ය අනුමණ්ඩලය මගින් ඉදිරිපත් කරනු ලබයි.

මෙම මණ්ඩලය සිංහල සාහිත්‍යයේ උන්නතිය සඳහා කටයුතු කරන අයට අත්දීමක් වශයෙන් තරගාවලියක් ඉදිරිපත් කිරීමට හා සාහිත්‍ය උත්සවයක් පැවැත්වීමට කටයුතු කෙරේ. ඒ සඳහා නිව්සවුත්වේල්ස්හි ස්කැටිස් සංවිධානය හා එස්.බී.එස්.ගුවන්විදුලියේ සිංහල අංශය ඒකාබද්ධව කටයුතු කෙරේ. මෙහි අරමුණ වනුයේ ඕස්ට්‍රේලියාව පුරා විසිරී සිටින සාහිත්‍ය රස කාමීන්ට ඔවුන්ගේ කුශලතා වර්ධනය කරගැනීමට රුකුලක් දීමය. දවස පුරා පැවැත්වෙන දේශන සම්මන්ත්‍රණ හා සාකච්ඡා සමග සැමට සංවාදශීලී අවස්ථාවක්. මෙවර පැවැත්වෙන උත්සවය පද්‍ය සාහිත්‍යය අළලා වන අතර, පද්‍ය රචනා තරගයකින් ද සමන්විතවේ.

තරග සඳහා සඳැස් නිසඳැස් කාව්‍ය ඉදිරිපත් කිරීමට හැකිවනු ඇත. ජයග්‍රාහකයින් සඳහා සහතික පත් ප්‍රදානය කෙරේ.

තරග නීති,
සංක්‍රමණ චින්තා යන මාතෘකාව යටතේ ""
""සංක්‍රමණ අත්දැකීම් ගැන කියැවෙන සඳැස් හෝ නිසඳැස් පද්‍ය රචනා එවිය යුතුය. එම අංශ දෙකින්ම පළමු, දෙවැනි හා තුන්වැනි ජයග්‍රාහකයන් තෝරා ගැනේ. ජයග්‍රාහකයන් හයදෙනෙක් සඳහා සහතික පත් ප්‍රධානය කෙරේ.

සියලු රචනා කවිපංති පහත් දහයත් අතර විය යුතුය. කාව්‍ය රීති අනුගමනය කළ යුතුය. ශාස්ත්‍රීය බව, සම්භාව්‍ය බව හා රසනුසුන් බව රැකිය යුතුය. කෙනෙකුට හෝ දේශයකට අවමන් නොවන සංකල්ප විය යුතුය. ඕස්ට්‍රේලියාව පුරා විසිරී සිටින කවියට ලැදි කවර වයස් තලයක වුව ද ගැහැණු පිරිමි අයට මේ සඳහා ඉදිරිපත් විය හැකිය. සාහිත්‍ය අනු මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

රචනයෙහි තමන්ගේ නම සඳහන් නොකළයුතු අතර, නම හා ලිපිනය වෙනත් කොළයක සටහන් කර එවිය යුතුය.
ඡහඉනටහඅ ඡඹමපඑටඉටඉඹන, ඈ ඹඹහ 296 බඑලලයවඉලලඑ ෂ්‍රී 2155 යන ලිපිනයට සැප්තැම්බර් මස 20 වැනි දිනට පළමුව එවිය යුතුය.
සාහිත්‍ය චින්තා උත්සවය ඔක්තෝබර් මාසයේ 15 වැනි සෙනසුරාදා පැවැත්වේ.
පැවැත්වෙන ස්ථානය,
Epping Baptist Church Conference Hall, Corner of Carlingford Road and Ray Road.
පැවැත්වෙන වේලාව, පෙරවරු 9.00 සිට පස්වරු 5.00 දක්වා

For more information please listen to SBS Sinhala progamme on every Sunday.


ශ්‍රී ලාංකික ඇට මිදුළු දායක ලේඛනයේ ලියාපදිංචි දායකයින් ගණන
242
ජීවිතයක් කොයි තරම් වටිනවද ?
ශ්‍රී ලාංකික පුරාවේ සාමූහික ප්‍රයත්නයක්

අසරණ රෝගීන්ගේ ජීවිත ගලවා ගැනීමට උපකාර වන ඇට මිදුළු පරිත්‍යාග කරන්නට කැමති ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පරිත්‍යාගශීලීන්ගේ නාම ලේඛණය දිනෙන් දින වැඩෙමින් පවතියි. මේ උතුම් කාර්යය වෙනුවෙන් පැවැත්වෙන මීළඟ සැසිය සැප්තැම්බර් 11 වන දා සවස 2 ට ඩැන්ඩිනොන් සවුත් ප්‍රයිමරි පාසල් ශාලාවේදී පැවැත් වෙයි. ඔබත් සහභාගිවන්නට කැමති නම් කරුණාකර අංක 0416 138 097 ඔස්සේ ලීලානන්ද අමතන්න.

Lak Medura Foundation
ලක් මැදුර පදනම

28-08-2005 දින පැවැති ලක්මැදුර පදනමේ මහ සභා රැස්වීමේදී ඉදිරි වර්ෂය සඳහා පහත නම් සඳහන් අය නිලධාරී මන්ඩලය වශයෙන් තෝරාපත් කරගනු ලැබු බව මෙයින් දන්වා සිටිමු.

සභාපති සහ
මහජන නිලධාරී- ශාන්ත සුභසිංහ
ලේකම් - කෞෂාල් මීගම
භාන්ඩාගාරික - P.K. සමරකෝන්
උප සභාපති - මහින්දලාල් හේවාවසම්
උප ලේකම් - ලක්කන ප්‍රනාන්දු
උප භාන්ඩාගාරික- ඩෙන්සිල් ජයවීර

කාරක සභිකවරු
ලාල් පෙරේරා
සමන් රන්වල
තමේ□ ලොකුගලප්පත්ති
සුනන්ද කුරේ
කෙනත් පාඩකෝරාල

අභ්‍යන්තර විගනණ
නිලධාරී
තිලකරත්න රණතුංග

විස්තර සඳහා
සභාපති -
ශාන්ත සුභසිංහ 9464 1354 -
0413591625
ලේකම් -
කෞෂාල් මීගම 9307 6043